# ජාතික උරුමයක් වන දේශීය වෛද්‍ය විද්‍යාව ආරක්ෂා කොට පෝෂණය කිරීම වගකීමක්

## මිලින්ද මොරගොඩ

නුගේගොඩ - සෝමපාල විජේවර්ධන

ජාතිය සතු මහත් උරුමයක් වන දේශීය වෛද්‍ය විද්‍යාව ආරක්ෂා කර පෝෂණය කිරීම යුගයේ අප සතු විශාල වගකීමක් යැයි දේශීය වෛද්‍යවරුන් සඳහා නව සංවිධානයක් පිහිටුවීම නිමිත්තෙන් පැවැති රැස්වීමකදී මිලින්ද මොරගොඩ මහතා පැවැසීය.

දේශීය වෙදකම ආරක්ෂා කිරීම හා එහි උන්නතිය සඳහා කැපවුණු වෛද්‍යවරුන් හඳුනාගෙන ඔවුන් ඒකරාශි කිරීම, අගැයීමට ලක්කිරීම හා දිරිමත් කිරීම අභාවයට යන දේශීය වෛද්‍ය ක්‍රම නගා සිටුවීම ඒවා සුරක්ෂිත කිරීම, නවතම පර්යේෂණ මගින් දේශීය වෛද්‍ය විද්‍යාව ප්‍රචලිත කිරීම, ආදී කරුණු රාශියක් පෙරදරිකරගෙන මෙම රැස්වීම සංවිධානය කර තිබිණි.

වෛද්‍ය රංජිත් අබේවර්ධන මහතාගේ උපදෙස් පරිදි මිලින්ද මොරගොඩ ආයතනය මගින් සංවිධානය කර තිබූ මෙම රැස්වීම තිඹිරිගස්යායේ පිහිටි එම ආයතනයේදී පැවැත්විණි.

තවදුරටත් කතා කළ මිලින්ද මොරගොඩ මහතා, අපේ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳව මුළු ලෝකයේම අවධානය යොමුවී තිබෙනවා.. ඒකට ප්‍රධාන හේතුව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රඳා පවතින්නේ ශාකසාර මත නිසායි. ශාකසාර ඖෂධවලට පෙරට වඩා නැඹුරුවීමක් අද දකින්න තිබෙනවා. එම බෙහෙත් හේත්වලට පමණක් නොවේ, ආහාරපාන, අලේපන ආදියටත් අද ලොව විශාල ඉල්ලුමක් පවතිනවා. ඒ නිසා දේශීය වෛද්‍ය ක්‍රමය පෝෂණය කරලා ආරක්ෂා කරලා අපේ දක්ෂ වෛද්‍යවරුන් පෙරමුණට ගෙනවිත් දේශීය වෛද්‍ය ක්‍රමය නව තවත් දියුණු කිරීමට අවශ්‍ය සියලුම සහයෝගය ලබාදීමට මිලින්ද මොරගොඩ ආයතනය සූදනම් යැයිද පැවැසීය.

මෙහිදී 'දේශීය වෛද්‍ය සංවර්ධන පෙරමුණ' නමින් නව සංවිධානයක්ද පිහිටුවා ගනු ලැබිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ හිටපු විදුහල්පති සහ බොරැල්ල ආයුර්වේද රෝහලේ පංචකර්ම අංශයේ හිටපු ප්‍රධානී වෛද්‍ය කුරේ විද්‍යාසේකර යන මහත්වරු නව සංවිධානයේ අනුශාසකවරුන් වශයෙන් පත්වූහ.

ප්‍රධාන නිලධාරී මණ්ඩලයට වෛද්‍ය වොෂින්ටන් නානායක්කාර මහතා, ප්‍රධාන සභාපති වශයෙන්ද, වෛද්‍ය ප්‍රසන්න අමරසිංහ මහතා උ. සභාපති වශයෙන්ද, වෛද්‍ය ඒ.පී.කේ. වික්‍රමාරච්චි මහතා ලේකම් වශයෙන්ද, වෛද්‍යාචාරිනී විශාඛා සූරියබණ්ඩාර මහත්මිය උපලේකම් වශයෙන්ද, වෛද්‍ය උදේනී පෙරේරා මහතා භාණ්ඩාගාරික වශයෙන්ද, වෛද්‍ය රංජිත් අබේවර්ධන මහතා දිස්ත්‍රික් සංවිධායක වශයෙන්ද මෙහිදී පත්කරනු ලැබූ අතර මාධ්‍ය ලේකම් වශයෙන් වෛද්‍ය ප්‍රියා විජේවර්ධන මහත්මිය පත්වූවාය.

වෛද්‍ය ශිෂ්‍ය එච්. ධර්මරත්න හිමි සහ එල්.එම්.පී. පෙරේරා, රොෂාන් විතාරණ, ජනක සමරක්කොඩි විජේමාන්න සහ මල්ලිකා දසනායක යන වෛද්‍යවරු කාරක සභාව සඳහා තේරීපත් වූහ.